**බුද්ධශාසන අරමුදල - 2020**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම , අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 6,578,146 | සමීක්ෂණ මණ්ඩල වාර්තා | 2022/12/31 දිනට ධර්ම ග්‍රන්ථ තොග සමීක්ෂණයක් සිදුකර ඇති අතර ඒ අනුව සිදුකළ යුතු ගැලපීම් 2023 වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමින් පවතී. | සමීක්ෂණය සිදු කර කඩිනමින් වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | සුනාමි ආධාර | 1,348,796 | විස්තරාත්මක තොරතුරු | සුනාමියෙන් ව්‍යසනයට පත් වෙරලාසන්න විහාරස්ථානවලට ආධාර ලබාදීම සඳහා ලද පරිත්‍යාග මුදලකි. මෙය දැනට ලෙජර් ගිණුමක ඉදිරියට ගෙන එමින් පවතී. ඉදිරියේදී පැවැත්වීමට නියමිත 89 වන පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් පසු බුද්ධශාසන අරමුදල් ගිණුමට එකතු කිරීමට සැලසුම් කර ඇත. | විස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු මුදල් | 13,031,828 | ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණය | අදාල ශේෂයන් 2023 වසර තුළදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | ශේෂය සනාථ කළ හැකි තොරතුරු සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව. |
| (ඈ) | ජංගම වගකීම් | 1,712,435 | ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණය | එම ශේෂයන් 2023 වසර තුළදී නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැරකිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂය සනාථ කළ හැකි තොරතුරු සහ වයස් විශ්ලේෂණය ඉදිරිපත් කළ යුතු බව. |
| (ඉ) | ගෙවීම් වවුචර | 1,903,671 | ලදුපත් | ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා එම මුදල් ලද බවට ආදායකයාගෙන් ලදුපත්/අත්සන් ලබාගැනීමට අවශ්‍ය උපදෙස් නිළධාරීන් වෙත ලබාදී ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව, ගෙවීම් ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ ලදුපත් අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබු රු.13,031,828 ක් වු ලැබිය යුතු අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් ශේෂයෙන් රු.1,087,447 ක් වර්ෂ 08 කට සහ රු.11,944,381 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් (පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව) වු අතර මෙම වාර්තාවේ දිනය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂයන් 2023 වසර තුළදී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය. | අදාල ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.544,409 ක් වසර 06 කට සහ රු.1,168,025 ක් වසර 05 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂයන් 2023 වසර තුළදී නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැරකිරීමට කටයුතු කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවතෙන අදාල ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 396 | 2013 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදි අරමුදල විසින් නිකුත් කරන ලද එකතුව රු.154,363 ක් වූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම චෙක්පත් 2023 මැයි මස බුද්ධශාසන අරමුදල් ගිණුමට බැරකිරීමට කටයුතු කර ඇත. | චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) | මුදල් රෙගුලාසි 757 | ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කඩිනමින් භාණ්ඩ සමීක්‍ෂණයක් සිදුකර විගණකාධිපති වෙත වාර්තාව යොමුකිරීමට සටහන් කර ගතිමි. | භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 48,920,642 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,513,190ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,407,452ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 264 අනුව සෑම ගෙවීමක්ම, වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් ඇතැම් ගෙවීම් වවුචර් සමඟ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් තොරව අමුණා තිබුණි. | ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා එම මුදල් ලද බවට ආදායකයාගෙන් ලදුපත්/අත්සන් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිළධාරීන් වෙත ලබාදී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල ගෙවීම් ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් ඊට අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) | අරමුදලෙන් දීමනා, ආධාර වැනි ගෙවීම් කිරීමේදී බොහෝ අවස්ථාවල අදාල කාලසීමාව ඉකුත්වී මාස කිහිපයකට පසු ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව, එකතුව රු.4,160,656 කට අදාලව මාස 04 සිට මාස 24 දක්වා ප්‍රමාදයන් සිදුවූ අවස්ථා 18 ක් විය. | ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග වන්නේ කලින් මස කරනු ලබන ගෙවීම් වලට අදාල ලදුපත ලැබුනු පසු ඊලඟ මාසයේ ගෙවිම් කිරීම සිදුකිරීමයි. ඒ අනුව ලදුපත ලැබීමේ ප්‍රමාදයකන් මත ගෙවීම් ප්‍රමාද වේ. වර්තමානයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් මඟින් ඉක්මනින් ලදුපත් ගෙන්වා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර ඇත. | අප්‍රමාදව ගෙවීම් සිදු කළ යුතු බව. |
| (ඇ) | 2020 වර්ෂයට අදාළව අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාළව ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බැවින් අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | 2020 වර්ෂයට අදාළ ප්‍රගති වාර්තාව 2021.02.25 දින පැවැති පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අරමුදල ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවෙහි, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශය ඇතුළත් කර නොතිබූ අතර වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම, පරිත්‍යාග සහ වෙනත් ලැබීම් සහ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ කාර්යසාධනය සහ කාර්යසාධන දර්ශක ඇතුළත් කර නොතිබුණි. | අදාළ කරුණු වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි. | අදාළ කරුණු සම්පූර්ණ කර වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්පූර්ණ ලෙස ඉදිරිපත් කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (2) (ඇ) අනුව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමු කළයුතු වුවත් 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සහ කාර්යසාධන වාර්තාව වසර දෙකක ප්‍රමාදයකින් පසු 2023 ජුනි 20 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | 2019 මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා 2022.11.30 දින විගණනය වෙත භාර දී ඇති අතර ඊට අදාල විගණන වාර්තාව 2023.01.31දින ලබා දී ඇත. 2022.12.31 දක්වාම අවසාන ගිණුම් මේ වන විට පිළියෙල කර පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, එම වාර්තා 2023 .06.02 වන දින විගණනය වෙත ඉදිරිපත්කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල කාල සීමාව තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව. |

### 4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (2) (ඉ) අනුව අරමුදලේ මූල්‍ය වාර්තා, කාර්යසාධන වාර්තා සහ විගණනය කර ලබා දෙන විගණන වාර්තා ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත විධිවිධාන යටතේ භාෂාත්‍රයෙන්ම සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2018 සහ 2019 වර්ෂවලට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තා මෙම වාර්තාවේ දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, කඩිනමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය අනුව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් ලැබී නොමැත. | අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව. |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 877 (1) (ඇ) අනුව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2020 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය, පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම 2020 සැප්තැම්බර් 07 දින සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, 2020 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කොරෝනා වසංගත තත්වය මත 2019 අගෝස්තු 27 දිනෙන් පසු පාලක මණ්ඩලය කැඳවීමට අපහසු වූ බැවින් ඉන්පසුව 2020 සැප්තැම්බර් 07 දින පැවැත් වූ පළමු පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත. ඉදිරියේදී මහා භාණ්ඩාගාරය වෙත යොමුකර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වියදම් දැරීම සඳහා අයවැය මඟින් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගතයුතු බව. |